ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

භූගෝල විද්‍යාව 11

දෙවන වාර පරීක්ෂණය

13 ශ්‍රේණිය කාලය පැය 03

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ
- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

1 කොටස

01) i) පාංශු නිර්මාණය කෙරෙහි බලපාන භෞතික සාධක හතරක් නම් කරන්න (ල: 02)

Ii) පාංශු පැතිකඩ ඇඳ නම්කර එක් එක් පාංශු මහල් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න

(ල: 06)

Iii) පහත ශ්‍රී ලංකා සිතියමේ A-F දක්වා අක්ෂර වලින් දක්වා ඇත්තේ රතු දුඹුරු පස ව්‍යාප්ත වී ඇති දිස්ත්‍රික්ක හයකි. එම දිස්ත්‍රික්ක නිවැරදිව පිළිවෙලින් නම් කරන්න.




(ල: 06)

iV) පාංශු බාදනය හා හායනය අතර වෙනස පැහැදිලි කරන්න. (ල: 06)

**02)** I) ලෝකයේ ප්‍රධාන හුණුගල් ප්‍රදේශ දෙකක් පහත ලෝක සිතියමේ A,B අක්ෂර වලින් ලකුණු කර ඇත. එම ප්‍රදේශ නම් කරන්න




(ල: **02**)

Ii) හුනුගල් නිර්මාණය වන ප්‍රධාන ක්‍රමදෙක කෙටියෙන් පැහැදිලි කරන්න (ල: **06**)

Iii) කාස්ට් භූරූප හයක් නම් කරන්න. (ල: **06**)

iv) ඉහත iii හි ඔබ නම්කල භූරූප හයෙහි නිර්මාණ ක්‍රියාවලිය සුදුසු රූපසටහන් සහිතව විස්තර කරන්න (ල: **06**)

**03)** i) El Nino (එල්නිනෝ) දේශගුණික සංසිද්ධිය කෙටියෙන් පැහැදිලි කරන්න (ල: **02**)

Ii) දේශගුණ වෙනස්වීම් වලට බලපාන මානුෂ සාධක තුනක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ල: **06**)

Iii) ගෝලීය දේශගණය වෙනස්වීම මගින් සිදුවන ප්‍රතිවිපාක හතරක් සාකච්ඡා කරන්න (ල: **06**)

iv) දේශගුණ වෙනස්වීම්වල තීව්‍රතාව අවම කරගැනීමට මිනිසාට දායකවිය හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න (ල:**06**)

04) i) ස්වාභාවික උපද්‍රවයක් හා ආපදාවක් යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල:02)

Ii) ලෝකයේ බහුලව දැකිය හැකි ස්වාභාවික උපද්‍රව හයක් සහ එම උපද්‍රව වලට මුහුණපාන රටවල් හයක් දක්වන්න (ල:06)

Iii) ආපදා කළමනාකරණ චක්‍රයෙහි (Disaster Management Cycle) ප්‍රධාන අදියර හතර කෙටියෙන් විස්තර කරන්න (ල:06)

iV) ස්වාභාවික ආපදා මානව කටයුතු මගින් තීව්‍ර වන ආකාරය කරුණු ඇසුරින් පැහැදිලි කරන්න (ල:06)

## 11 කොටස
## මානුෂ භූගෝල විද්‍යාව

05)i) ජන සංඛ්‍යාවේ ඓතිහාසික දත්ත වලට අනුව ජන සංඛ්‍යා වර්ධනයේ දැකිය හැකි කැපී පෙනෙන අවධි දෙක දක්වන්න (ල:02)

II) ලෝකයේ උපත් ශීඝ්‍රතා හා මරණ ශීඝ්‍රතා අනුව විවිධ හැඩගන්නා පිරමීඩ වර්ග හතරක් පහත දක්වා ඇත.එම පිරමීඩ වර්ග හතර හඳුනාගෙන නම් කරන්න (ල:06)




III) පහත වගුවෙන් දැක්වෙන්නේ ලෝකයේ සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් කිහිපයක දළ උපත් අනුපාතිකයයි

| සංවර්ධිත රටවල් | |
|---|---|
| ජපානය | 8.07 |
| දකුණු කොරියාව | 8.26 |
| සිංගප්පූරුව | 8.1 |
| ඇ.එ.ජනපදය | 13.42 |
| එක්සත් රාජධානිය | 12.22 |

| සංවර්ධනය වෙමින් පවතින රටවල් | |
|---|---|
| නයිජර් | 46.12 |
| මාලි | 45.33 |
| උගන්ඩා | 44.17 |
| සැම්බියා | 42.46 |
| බර්කිනා ෆාසෝ | 42.42 |
| පාකිස්ථානය | 23.19 |
| බංග්ලාදේශය | 21.61 |
| ඉන්දියාව | 19.89 |

මූලාශ්‍රය:- එ.ජාතීන්ගේ සංගනන වාර්තාව

ඉහත වගුවේ දත්ත වලට අනුව ලෝකයේ දළ උපත් අනුපාතිකයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියන්න

(ල:06)

iV) ජන සංක්‍රමණ නිසා ප්‍රභව රටවලට ලැබෙන ධනාත්මක ප්‍රතිඵල තුනක් දක්වා පැහැදිලි කරන්න

(ල:06)

06) i) "වර්තමානය වන විට නාගරිකරණය දේශ සීමා අභිබවා ඉන් බැහැරට ව්‍යාප්ත වී ඇත." එසේ නාගරිකරණයට පත්වූ කලාප තුනක් දක්වන්න (ල02)

Ii) ඉහළ නාගරිකරණ මට්ටමක් ඇති,

A- ආසියාතික රටවල් දෙකක් හා

B- අඩුම නාගරිකරණ මට්ටමක් ඇති, අප්‍රිකානු හා ආසියානු රටවල් දෙක බැගින් දක්වන්න

(ල:06)

Iii) ලෝකයේ අතිකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ අඩු නාගරික මට්ටමක් පැවතීම කෙරෙහි බලපා ඇති සාධක තුනක් කෙටියෙන් විස්තර කරන්න (ල:06)

iV) සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරිකරණය ආශ්‍රිත ගැටළු පහක් සාකච්ජා කරන්න

(ල:06)

07) i) පහත සඳහන් ලෝක සිතියමෙහි ලෝකයේ ඛනිජතෙල් කෙත්වල ව්‍යාප්තිය දක්වයි



ඉහත ලෝක සිතියමෙන් පෙන්වන ඛනිජතෙල් කෙත් ව්‍යාප්තියේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් හඳුන්වන්න (ල:02)

Ii) ලෝක ගල් අඟුරු නිෂ්පාදනය හා වෙළඳාමේදී දැකිය හැකි කැපී පෙනෙන ලක්ෂණ 04ක් නිදසුන් මගින් පැහැදිලි කරන්න (ල:06)

Iii) ලෝකයේ කර්මාන්ත ස්ථානගත වීමේදී අමුද්‍රව්‍ය යන සාධකය කොතරම් දුරට තීරණාත්මක සාධකයක් වන්නේ දැයි ඔබ ඉගෙනගත් කර්මාන්ත ඇසුරින් පැහැදිලි කරන්න (ල:06)

iV) ඛනිජ සම්පත් ඌන රටක් වුවත් ජපානය තුළ කර්මාන්ත ස්ථානගත වීමේදී සිදුවූ සුවිශේෂීතාවය නිදසුන් මගින් පැහැදිලි කරන්න (ල:06)

8)i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප හතරක් නම් කරන්න (ල:02)

Ii) සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන අන්දම පෙන්නුම් කරන සාධක හතරක් පැහැදිලි කරන්න (ල:06)

Iii) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් ගෙන තිබෙන පියවර දෙකක් විස්තර කරන්න (ල:06)

iV) සංචාරක කර්මාන්තයෙන් රටට සිදුවන ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම් එක බැගින් කෙටියෙන් පැහැදිලි කරන්න (ල:06)